M267

# දෙමාපියන් රැකියා සඳහා විදේශගතවීම එම දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන ආකාරය

පිළිබඳව

## හෝමාගම අධ්‍යාපන ප්‍රදේශය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණාත්මක නිබන්ධනය

UCLIB
431896

( එස්. කුමාරගේ )

83/ M.Phil/06

1990.08.25

431896
GR

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.03.
ශ්‍රී ලංකාව.

සංක්ෂේපයෙන්......

රැකියා සඳහා විදේශ ගත වන්නන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීම, මෑත කාලයේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ක්ෂේත්‍රයන්හි වෙනස්කම් රාශියක් සඳහා හේතු වූ බව පෙනේ. එයින් මෙරට සමාජයට එල්ල වන බලපෑම් පිළිබඳව සංවාදයකට එළඹීමේ අවශ්‍යතාවය දැනට මතු වී ඇත. මෑත කාලීන විදේශ සේවා නියුක්තියේ ස්වභාවය විමසන විට එය එක් සමාජ ඛණ්ඩයකට හෝ වරප්‍රසාද ලත් එක්තරා පන්තියකට පමණක් ලැබුණු අවස්ථාවක් නොවන බව පෙනේ. විවිධ අධ්‍යාපන මට්ටම්වලට අයත් වූ, නාගරික හා ග්‍රාමීය ජන කොටස්ද, පිරිමින් මෙන්ම කාන්තාවන් ද විදේශ රැකියාවන් හි නිරතවීම නිසා මෙරට සමාජයේ පුළුල් ප්‍රතිකඩකට විවිධ බලපෑම් ඇති වී ඇත.

රැකියා සඳහා මෙරට ජනයා ඇදී යාමට විවිධ හේතූන් බලපෑව ද රැකියා විරහිත භාවය හා ඌන සේවා නියුක්තිය ඉන් ප්‍රධානය. වැඩි දෙනා මෙරට නිරතව සිටි රැකියා හැර දමා විදේශ රැකියා සොයා ගියේ ඉහළ වැටුප් ලබා ගැනීමේ පරමාර්ථයෙනි. මෑත කාලයේ විදේශ රැකියා සොයා ගිය පිරිස අතරින් වැඩි සංඛ්‍යාව මැද පෙරදිග රටවලට යොමු වූ බව පෙනේ.

විවාහකයන් විදේශ ගත වීමේ දී අඹු දරුවන්ගෙන් වසර කිහිපයකට හෝ වෙන්ව සිටීමට සිදුවීම දරුවන්ට අහිතකර ලෙස බලපායි. ළමා සංවර්ධනය පිළිබඳ එක් එක් අවධීන්හි දී දෙමාපිය අනුග්‍රහය අහිමි වීමෙන් සංවර්ධනයේ ඌනතා ඇති වේ. එමෙන්ම මව/පියා පවුලෙන් ඈත් වීම නිසා පවුල් පරිසරය තුළ අස්ථාවරතා ඇති වීම, අන්තර් පුද්ගල සම්බන්ධතා දුර්වල වීම හා දරු දෙගුරු සම්බන්ධය පළුදුවීම, නිසා දරුවන් තුළ ඇති වන මානසික ගැටළු මෙන්ම, දිරි ගැන්වීම් හා, සුපරීක්ෂණය මනා ලෙස සිදු නොවීම ආදී හේතූන් ද දරුවන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපායි.

දෙමාපියන් විදේශ රැකියා සඳහා යාමෙන් පසුව ඔවුන්ගේ ආර්ථික තත්ත්වය යහපත් වීම දරුවන් ගේ අධ්‍යාපනයට හිතකර ලෙස බලපා තිබේ ද

නැතහොත්, දෙමාපියන් දරුවන්ගෙන් වෙන් වීම නිසා උදාවන තත්ත්වය අධ්‍යාපනයට, අහිතකර ලෙස බලපා තිබේ ද යන්න මෙම අධ්‍යයනයේ දී විමසා බලන ලදි.

පර්යේෂණය, මූලික සමීක්ෂණය හා සුවිශේෂ අධ්‍යයනය යන අවස්ථා දෙකකින් සමන්විත විය. හෝමාගම අධ්‍යාපන ප්‍රදේශයේ 7 වසර පන්තිවල ඉගෙනුම ලැබූ, විදේශ රැකියා සඳහා ගොස් සිටි දෙමාපියන් ගේ දරුවන් 200 ක් මූලික සමීක්ෂණ නියැදියට අයත් විය. එම සිසුන් අතරින් අහඹු ලෙස තෝරා ගත් සිසුන් 25 දෙනා ද, ඔවුන් ගේ ගුරුවරුන් හා මා පිය භාරකරුවන් ද සුවිශේෂ අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. එයින් අපේක්ෂා කළේ මූලික සමීක්ෂණයෙන් අනාවරණය වූ තොරතුරු පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමය. මූලික සමීක්ෂණයේ දී දත්ත සපයා ගැනීමට ප්‍රශ්නාවලිය භාවිතා කරන ලද අතර, සුවිශේෂ අධ්‍යයනයේ දී සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා ලිඛිත මූලාශ්‍ර යොදා ගන්නා ලදි. සවිස්තරාත්මක අනාවරණයක් නිසා සපයා ගත් දත්ත විශ්ලේෂණය ප්‍රතිශත භාවිතයෙන් සිදු විය.

දත්ත විශ්ලේෂණය හා අර්ථ කථනය පහත සඳහන් මාතෘකා ඔස්සේ සිදු වේ. මූලික අධ්‍යයනය ඇසුරින් ලබා ගත් දත්ත මගින් විදේශ ගත වූ දෙමාපියන් ගේ ගති ලක්ෂණ, දරුවන්ට ලැබුණු පහසුකම්, ආධාර හා වැඩිහිටි සහයෝගය, දරුවන් මුහුණ පෑ ගැටළු හා දුෂ්කරතා, දරුවන් අධ්‍යාපන කටයුතු කෙරෙහි දක්වන උනන්දුව, හා අධ්‍යාපන ප්‍රගතිය විමසා බලන ලදි. සුවිශේෂ අධ්‍යයනයෙන් ලබා ගත් දත්ත ඇසුරින් සිසුන් අයත් වන පවුල්වල ස්වභාවය, භාරකරුවන්ගේ ස්වභාවය, මව/පියා පිටරට යාමෙන් පසු දරුවන්ට ලැබුනු විශේෂ පහසුතා, ඔවුන් මුහුණ පෑ අපහසුතා හා ගැටළු, අධ්‍යාපන කටයුතු සඳහා ලැබුණු පහසුකම් හා ඇති වූ අපහසුතා, ඔවුන් ලැබූ අධ්‍යාපන ප්‍රගතිය විමසා බලන ලදි.

ඒ ඇසුරින් එළඹිය හැකි ප්‍රධාන නිගමනය වූයේ දෙමාපියන් විදේශ රැකියා සඳහා යාමෙන් පසු දරුවන්ට යම් යම් භෞතික පහසුකම්, අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වන පොත්පත්, ද්‍රව්‍ය හා වියහියදම් දැරීමට මුදල් ලැබී ඇතත්, ඔවුන් අධ්‍යාපන කටයුතු පිළිබඳව සැලකිය යුතු ප්‍රගතියක් ලබා නොමැති බවයි. මව/පියා විදේශ රැකියාවට යාමෙන් පසුව දරුවන් මුහුණ පෑ විවිධ ගැටළු නිසාත්, අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මග පෙන්වීම නිසියාකාරව සිදු නොවීම නිසාත්,

අධ්‍යාපන කටයුතු අතින් ප්‍රගතියක් ඇති නොවූ බව පෙනේ.

එනිසා විදේශ රැකියාවන් හි නිරතවීමට අපේක්ෂා කරන විවාහකයින් තම දරුවන් ගේ භාරකාරිත්වය, ආරක්ෂණය, පිළිබඳව මෙන්ම පවුලේ අභ්‍යන්තර සංවිධාන ව්‍යුහයේ අඛණ්ඩතාවය රැකීම පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය. විදේශ රැකියා සඳහා යන දෙමාපියන්ගේ දරුවන් මුහුණ පාන ගැටළු පිළිබඳව සංවේදීව ඒ ගැටළු වළක්වා ගැනීම සඳහා මෙන්ම ඒවාට පිළියම් වශයෙන් පාසල යන : මෙන්ම රජය මගින් ද ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහන් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අවසාන කොටසේ දී සිදු කෙරේ.